# අනුකරණය හා අවශෝෂණය

අමරදේව මහතාගේ ගීතවලට පිළිගැනීමක් ලැබෙන්නේ ප්‍රබුද්ධ යැයි කියා ගන්නා සමාජයෙහි ය. ඒ සමාජයෙහි භාතිය හා සන්තුෂ් යන මහත්වරුන්ගේ ගීත සම්භාව්‍ය යැයි නොපිළිගැනෙයි. ඔවුන්ගේ ගීත ජනප්‍රිය වන්නේ වෙනත් ම තලයක ය. මෙයට හේතුව කුමක් ද? අනෙක් අතට අමරදේව මහතාගේ සංගීතය උත්තර භාරතීය රාගධාරී ශාස්ත්‍රීය සංගිතය යම් ප්‍රමාණයකට හෝ හොඳින් හැදෑරුවන්ට ප්‍රියජනක නොවේ. ඔවුන්ට එය සම්භාව්‍ය තබා ප්‍රබුද්ධවත් නොවේ. ඔවුහු අමරදේව මහතාගේ සංගීතය හුදු ජනප්‍රිය ගීත පමණක් ලෙස සළකති. තවත් පැත්තකින් ගතහොත් ප්‍රේමසිරි කේමදාස මහතාගේ බටහිර සංගීතය අනුකරණය ජනප්‍රිය වන්නේ ඉතා ම ටික දෙනකු අතර පමණ ය. කේමදාස මහතා නිර්මාණ යනුවෙන් හඳුන්වන්නේ බටහිර සංගීත ඛණ්ඩ අමු අමුවේ ඉදිරිපත් කිරීමක් බව දන්නෝ දනිති. එහෙත් ඒ මහතාගේ සංගිතය ප්‍රිය කරන බව හඟවන බොහෝ දෙනා ඒ බව නොදනිති. එයට හේතුව ඒ අය බටහිර ශාස්ත්‍රීය සංගීතය ගැන කිසිවක් නොදැනීම ය. සිංහල කතාකරන සමාජයෙහි සමාජ තත්වය රැක ගැනීමක් කේමදාස සංගීතය අගය කිරීමෙන් සිදුවෙයි. මෙයින් පැහැදිළි වන කරුණ නම් යම් සංගීතයකට පිළිගැනීමක් ලැබෙන්නේ යම් සමාජ කණ්ඩායමක් තුළ බව ය. සංගීතය ඊනියා විශ්ව භාෂාවක් යැයි කීව ද එයට විශ්ව පිළිගැනීමක් නොමැත. සංගීතය පමණක් නොව බටහිර විද්‍යාව හා වෙනත් දැනුම් සම්බන්ධයෙන් ද තත්වය එසේම ය. එහෙත් සංගීතයෙහි පමණට බටහිර විද්‍යාව ආදී දැනුම් පද්ධතීන්හි අපට ඒ බව නොතේරෙයි. බටහිර විද්‍යාවට යෑමට පෙර කොයි කාටත් වඩා තේරෙන සංගීතය, සාහිත්‍යය ආදිය ගැන තව දුරටත් සාකච්ඡා කරමු.

අප රටේ ඇත්තේ පහළොස්වැනි සියවසේ යුරෝපයේ ඇරඹි බටහිර නූතනත්වය අනුකරණය කරන සමාජයකි. සමාජයෙහි ඉහළ සිට පහළට ම එය සිදුවෙයි. ඒ අතර අප පැරණි සමාජයෙහි යම් යම් දෑ ද තවමත් ඉතුරුව පවතියි. බටහිර සංස්කෘතික යටත්විජිතවාදය අප වෙත බලයෙන් පටවන බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය, එනම් බටහිර නූතනත්වයේ සංස්කෘතිය හා තරග වදිමින් සිංහල බෞද්ධ සංස්කෘතිය තවමත් පවතියි. සිංහල ක්‍රිස්තියානීන් ද ඇතුළු අප සියළු දෙනා තුළ ම පාහේ අඩුවැඩි වශයෙන් ගත්කල මේ සංස්කෘතීන්වල මිශ්‍රණයේ ප්‍රතිඵල දැකිය හැකි ය. පශ්චාත්නූතනත්වය යනුවෙන් හැඳින්වෙන ප්‍රපංචය ලංකාවේ තබා බටහිරවත් නැත. පශ්චාත්නූතනත්වය යනුවෙන් හැඳින්වෙන්නේ නූතනත්වයේ ම එක් අවධියක් පමණකි. මේ අවධියේ බලය තව තවත් සංකේන්ද්‍රීය වෙයි. දේශපාලනය වොෂිංටන් නුවරත් ආර්ථිකය හා සංස්කෘතිය නිව්යෝක් නුවරත් සංකේන්ද්‍රීය වෙමින් පවතියි. කලින් ලිපියක සඳහන් කර ඇති ආකාරයට බටහිර නූතනත්වය යුදෙව් - ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය, කෙටියෙන් කියන්නේ නම් යුදෙව් චින්තනය මත පදනම් වෙයි. බටහිර නූතනත්වයේ සීමාකම් එළිදරවු වන මේ නූතනත්වය කුණුවන අවධියේ වෙනත් චින්තනයක් සඳහා ඉල්ලුමක් නම් බටහිර ඇතිවෙමින් පවතියි. පශ්චාත්නූතනත්වය යනු නූතනත්වයේ කුණුවීම යැයි හැඳින්වීමේ නම් වරදක් නැත.

අමරදේව මහතා සුභාවිත ගීතය යන නමින් හඳුන්වන ගීතය සමාජයේ ඊනියා ප්‍රබුද්ධ කොටසෙහි ජනප්‍රිය වීමට පෙර ආනන්ද සමරකෝන්, සුනිල් ශාන්ත වැනි මහත්වරු නූර්ති ගීවලින් වෙන් වුණු වෙනත් ගීත සම්ප්‍රදායක් ඇති කර ගැනීමෙහි ලා වෙහෙස වෙමින් සිටියහ. මේ මහත්වරු ද එකල පැවති සිරිත අනුව ඉන්දියාවට ගොස් සංගීතය හදාරා පැමිණියෝ වෙති. කලින් සඳහන් කර ඇති පරිදි විශ්ව විද්‍යාලයට ගිය නොගිය කවුරුත් ශාස්ත්‍රීය අධ්‍යාපනය සඳහා බටහිර දෙස බැලූහ. ඉන් ඇතැම්හු නූතන විදග්ධ සිංහල සංස්කෘතියක් බිහි කර ගැනීම සඳහා ඉන්දියාව දෙස බැලූහ. එහෙත් බටහිර විද්‍යාව හා අනෙක් බටහිර ශාස්ත්‍ර ගැන කෙසේ වෙතත් මාර්ටින් වික්‍රමසිංහ මහතා වෙනත් සංස්කෘතිකාංග සම්බන්ධයෙන් ඉතා අදීන ලෙස කල්පනා කරමින් අතීතයේ දී අප ඉන්දියාවෙන් නිදහස් වීමට ක්‍රියා කර ඇති ආකාරය පෙන්නුම් කෙළේ ය. කුමාරතුංග මුනිදාස මහතා ඊටත් එහා ගිය බව අපි කීවෙමු. මේ අදහස් මෙරට සමාජයෙහි ද බලපෑම් ඇති කෙළේ ය. ආනන්ද සමරකෝන් හා සුනිල් ශාන්ත යන මහත්වරුන්ට ඒ අදහස් බල පෑ බවට සැකයක් නැත. ඔවුන්ට දේශජ සිංහල ගීතයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව විය.

එහෙත් සංගීතයවත්, විද්‍යාවවත්, දේශපාලනයෙන් මුළුමනින් ම නිදහස් නොවෙයි. ආනන්ද සමරකෝන්, සුනිල් ශාන්ත මහත්වරුන් පවත්වාගෙන යෑමට තරම් දේශපාලන බලවේගයක් මෙරට නොවී ය. විදග්ධ සිංහල සංස්කෘතිය බිහි කිරීමේ දේශපාලන බලය තිබුණේ විශ්ව විද්‍යාල ආයතනයේ පෙරදිග අධ්‍යයන පීඨයට ය. විශ්ව විද්‍යාල

© Prof. Nalin De Silva

ආයතනයටත් මේ පීඨයටත් නිදහස, නිර්මාණය, දේශීයත්වය ආදිය වහ කදුරු මෙන් විය. පසුගිය කාලය තුළ මෙරට පහළ වූ විශිෂ්ට විශ්ලේෂණාත්මක හා නිර්මාණාත්මක මනසක් තිබූ පඬිවරයා ලෙස සැළකිය හැකි කුමාරතුංග මුනිදාස මහතා මේ පීඨයෙන් පිටමං කරනු ලැබිණි. ඒ මහතා පළ කළ අදහස් එකක් සමගවත් එකඟ නොවුණ ද ඒ මහතාගේ අගය තේරුම් ගැනීමට එය බාධාවක් නොවිය යුතු ව තිබුණි. ඒ මහතා විශ්ව විද්‍යාලයෙන් කොන් කරනු ලැබුයේ අදහස්වල වැරැද්ද නිවැරැද්ද ගැන කරන ලද තක්සේරුවක් නිසා නොව ඒ අදහස් අනුකාරක විශ්ව විද්‍යාලයට තර්ජනයක් වූ බැවිනි. යම් සමාජයක් හෝ උප සමාජයක් (විශ්ව විද්‍යාලය ද උප සමාජයකි) යම් අදහසක් පිළිගන්නේ අදහසේ නිවැරදිතාවයට වඩා අදහස තමන්ට ගැලපෙන්නක් නම් ය. ඊනියා විද්‍යාත්මක විධි ක්‍රමයක් තිබේ යැයි කීව ද බටහිර විද්‍යාවේ ද මෙය සිදුවෙයි.

විශ්ව විද්‍යාලයෙහි අනෙක් පීඨවල මෙන් ම පෙරදිග අධ්‍යයන පීඨයෙහි ද අධිපතිවාදී චින්තනය වූයේ බටහිර යුදෙව් චින්තනය ය. එයට අමතර ව තමන්ට අනෙක් පීඨවලින් විශේෂයෙන් ම කලා පීඨයෙන් කෙරුණු කෙණෙහිළි කම්, හරමානිස් මිදි පුංචිකම්, වසා ගැනීම සඳහා ඔවුන්ට පැරණි භාරතීය චින්තනය අවශ්‍ය විය. පැරණි සිංහල චින්තනයෙහි ගත යුතු දෙයක් තිබිණි යැයි වැටහුණ ද බටහිර යුදෙව් චින්තනයට යට වූ මොවුන්ට භාරතීය චින්තනයෙන් අදීන වීමට නොහැකි විය. සංගීතය හෝ වෙන යමක් ඉගෙන ගැනීම සඳහා ඉන්දියාවට නොව ඕනෑම රටකට යෑම වරදක් නොවේ. එහෙත් වරද තිබුණේ අනුකරණයෙහි ය. වෙනත් සංස්කෘතියක දැනුමක් අනුකරණය නොකර අවශෝෂණය කරන්නේ කෙසේ දැයි ඔවුහු නොදත්හ. කුමාරතුංග මුනිදාස මහතාගේ අදහස් තබා පැරණි සිංහල සංස්කෘතියේ අදීනත්වය පිළිබඳ ව මාර්ටින් වික්‍රමසිංහ මහතා දැරූ අදහස්වත් ඔවුන්ට විෂය නොවී ය. එහෙත් මෙහි දී එක් කරුණක් කිව යුතු ය. අතීතයේ දී කෙසේ වෙතත් වර්තමානයේ දී අනුකාරකත්වයෙන් මිදෙන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ඔවුන්ට මාර්ටින් වික්‍රමසිංහ මහතාගෙන් වුව ද ලබා ගත හැකි දෙයක් නොවී ය. මේ වන විට මුළු මහත් උගත් සිංහල සමාජය ම සංස්කෘතික වශයෙන් භාරතයට ගැති වී සිටියේ ය. පෙරදිග අධ්‍යයන පීඨය පමණක් නොව පිරිවෙන්වල ද තත්වය එසේ ම විය. සිංහලයන් පැමිණියේ ඉන්දියාවෙන් ය, සිංහල භාෂාවේ මව් භාෂා පාලි හා සංස්කෘත වේය, සිංහලයන් පැමිණීමට පෙර, විශේෂයෙන් ම බුදු දහම හඳුන්වාදීමට පෙර, මෙරට කිවයුතු තරම් සංස්කෘතියක් නොවීය ආදී අදහස් එකල මෙරට පැතිරී තිබිණි. කුමාරතුංග මහතා මුළුමනින් ම මෙන් මේ අදහස්වලට විරුද්ධ විය. ඒ මහතාට පෙරදිග අධ්‍යයන පීඨයෙන් පමණක් නොව පිරිවෙන්වලින් ද විරුද්ධත්වයක් පැන නැගුණි.

කුමාරතුංග මහතා හා වික්‍රමසිංහ මහතා අතර වූ වෙනස යම් ප්‍රමාණයකට හෝ අවබෝධ කර ගැනීමට මෙය අවස්ථාවක් කර ගනිමු. අපේ විද්‍යා ප්‍රවාද ගොඩ නැගීමේ දී ඔවුන්ගේ අදහස්වල ඇති වටිනාකම් මෙන් ම දුර්වලකම් ද අපි අවබෝධ කර ගනිමු. වික්‍රමසිංහ මහතා පැරණි භාරතීය සංස්කෘතිකාංග සිංහල සංස්කෘතියට අවශෝෂණය කරගත් ආකාරය මූල ධර්මයක් ලෙස නිවැරදි ව හඳුනාගත්තේ ය. පැරණි සිංහල සංස්කෘතිය භාරතීය සංස්කෘතියෙන් අදීන බව ඒ මහතා අපට කියා දුන්නේ ය. එමෙන් ම ගැමියන් නිර්මාණාත්මක ව බටහිර සංස්කෘතිකයෙන් පවා යම් යම් දෑ ලබා ගත් ආකාරය ඒ මහතා ප්‍රකාශ කෙළේ ය. ග්‍රෙගරි යන්න ගිරිගෝරිස් වූ හැටි රේල් යන වචනයෙන් රේල් පාර, රේල් ගේට්ටුව, රේල්ලුව ආදී වචන තනාගත් ආකාරය ඒ මහතා විස්තර කෙළේ ය. එහෙත් ඒ මහතා බටහිර විද්‍යාව සම්බන්ධයෙන් තමා අනෙක් සංස්කෘතිකාංග ගැන කී දෙය නොපිළිපැද්දේ ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා බටහිර විද්‍යාවේ වහළකු වී යැයි කීම අතිශයෝක්තියක් නොවේ. එයට හේතුව බටහිර විද්‍යාව සංස්කෘතිකාංගයක් ලෙස නොදැකීම විය හැකි ය. අප බොහෝ දෙනා සංස්කෘතිය යැයි කී විට එයට විද්‍යාව ද ඇතුළු වන බව නොදනිති. අප විද්‍යාව නමින් හැඳින්වෙන බටහිර විද්‍යාව ගැන සිතන්නේ සංස්කෘතියෙන් ස්වාධීන වූ අංගයක් ලෙස ය. බටහිර විද්‍යාව ඊනියා වාස්තවික වූවක් ලෙස සැළකීමට පුරුදු වූ පසු එය සංස්කෘතිය මත හා ඒ ඔස්සේ චින්තනය මත පදනම් වන බව අපි අමතක කරමු.

මාර්ටින් විකුමසිංහ මහතා ඉතා දැඩිව වාස්තවිකත්වය, වියුක්තය හා යථාර්ථය විශ්වාස කෙළේ ය. මේ ගුණ තුන ම බටහිර විද්‍යවේ ඇතැයි පැවසෙයි. වියුක්තය කෙසේ වෙතත් වාස්තවිකත්වයක් හා යථාර්ථයක් නොමැති බව අපි දැන් දනිමු. එහෙත් වික්‍රමසිංහ මහතා ඒ බවක් දැන නොසිටියේ ය. ක්වොන්ටම් භෞතිකයේ දර්ශනය ගැන බටහිර ම ලියූ පොත පත එදවස ඒ මහතා තබා අද දවසේත් බොහෝ උගතුන් යැයි කියන අය කියවා නැත. යථාර්ථය යනු කුමක් දැයි අර්ථදැක්විය හැකි පුද්ගලයෙක් වේ ද? එසේ ඇත්නම් යථාර්ථය යනු කුමක් දැයි පැහැදිළි කර දෙන මෙන් අපි

© Prof. Nalin De Silva

ඉල්ලා සිටිමු. වාස්තවිකත්වය හා යථාර්ථය විශ්වාස කළ වික්‍රමසිංහ මහතා ඒ ගුණ බටහිරයන් කියන ආකාරයට සංස්කෘතියෙන් ස්වායත්ත යැයි සිතන්නට ඇත. එබැවින් බටහිර විද්‍යාව සිංහල සංස්කෘතිය තුළට අවශෝෂණය කරන්නේ කෙසේ ද යන ප්‍රශ්නය එතුමාට ඇති නොවන්නට ඇත. එහි ප්‍රතිඵලය වූයේ බටහිර විද්‍යාව අනුකරණය කිරීමටත් ඊනියා වාස්තවික යථාර්ථවාදී නවකතා හා කෙටිකතා නිර්මාණය කිරීමටත් එතුමා පෙළඹීම ය. එහි තවත් විපත්තිදායක කරුණක් ද විය. සිංහල ජාතක කතාව ද යථාර්ථවාදී ලෙස අර්ථකථනය කිරීමට ඒ මහතා ඉදිරිපත් විය. ජාතක කතාවේ තිබූ කලාව නැත්නම් රීතිය හඳුනා නොගෙන එය බටහිර කෙටිකතා සමග සංසන්දනය කිරීමට එතුමා පෙළඹුණේ ඇතැමුන් බුදු දහම බටහිර විද්‍යාව සමග සංසන්දනය කරන ආකාරයට ය. බටහිර විද්‍යාවට හා විද්‍යාත්මක යැයි පැවසුණු මාක්ස්වාදයට යටවීම මගින් ඒ මහතා තම අදීනත්වය යම් පමණකට කෙළෙසා ගත්තා පමණක් නොවේ. සිංහල නවකතාව හා කෙටිකතාව ද වැරදි මගකට යොමුකෙළේ ය. ඒ මහතාට එහි ලා මුල දී විශ්ව විද්‍යාලයේ පෙරදිග අධ්‍යයන පීඨයේ පූර්ණ සහාය ලැබුණි.

කුමාරතුංග මුනිදාස මහතා එයට වඩා වෙනස් විය. සිංහල සංස්කෘතියේ සියල්ල සඳහා ම අප ඉන්දියාවට ණය ගැති විය යුතු යැයි ඉතා දීනව කී යුගයක ඒ මහතා ඒ නිර්මාණය වූයේ හෙළයේ යැයි හඬ නගා කීවේ ය. එහි දී අවාසනාවකට ඒ මහතා භාරතයෙන් අප අවශෝෂනයෙන් ලබාගත් ඇතැම් දෑද ප්‍රතික්ෂෙප කෙළේ ය. සිංහල භාෂාව, සිංහල සංස්කෘතිය හා සිංහල ජාතිය මෙරට ජනිත වූ බව සැබෑ නමුත් එහි දී පාළි භාෂාවෙන් හා සංස්කෘතයෙන් මෙන් ම භාරතීය සංස්කෘතීන්ගෙන් අප අදින ව අවශෝෂණය කර ගත් දෑ ඇගයුමකට ලක් කළ යුතුව තිබුණි. ඒ අතර ඒ මහතා භාරතයේ අලංකාරවාදය අනුකරණයෙන් ලියූ කව් සිළුමිණ අගය කෙළේ ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා එහි දී ගුත්තිලය යථාර්ථවාදී රීතිය අනුව වර්ණනා කෙළේ ය.  මේ පඬිවරුන් දෙදෙනාගෙන් අප ඉගෙන ගත යුතු දෑ බොහෝ ය. ඇතැම් දුර්වල කම් තිබුණ ද ඔවුන් අපට යම් මගක් පෙන්වා ඇත. ඒ මග තවත් නිවැරදි කර ගැනීම අපේ වගකීම විය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva